Student/Registration Number

Centre Number

# 2022 Public Examination

# Sinhala
## Continuers Level

**Wednesday 19 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2022

**Part A** (Questions 1–3)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 1**

1. Apart from guest lectures for students, what does the company provide for other groups of visitors? **3**

- ______________________________
- ______________________________
- ______________________________

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 2**

2. (a) What is Ravi's cousin's attitude towards Mother's Day? **2**

(b) Why does Ravi's cousin think that Ravi is a good son? **4**

- 
- 
- 
- 

Marks | You may make notes in this space. These notes will NOT be assessed.

**Text 3**

3\. (a) How does the conversation with Saman affect Ruwanthi's holiday plans? **2**

______________________________________________

______________________________________________

______________________________________________

(b) Complete the table below, outlining the disadvantages of the changing weather conditions according to Saman and Ruwanthi. **4**

| **Saman** | **Ruwanthi** |
|---|---|
| • <br><br><br> • | • <br><br><br> • |

**Part B** (Questions 4–6)
(15 marks)

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

| | Marks | You may make notes in this space. These notes will NOT be assessed. |
|---|---|---|
| **Text 4** | | |
| 4. What are the four prerequisites for obtaining a Global Talent Visa in Australia?<br>ගෝලීය කුසලතා වීසා ලබාගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවයන් හතර මොනවාද? | **4** | |

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 5**

5. Explain how the flowers of the five plants are used to treat different skin diseases. **5**

   හමේ ඇතිවන විවිධ රෝග සඳහා ප්‍රතිකාර වශයෙන් ශාක වර්ග පහේ මල් යොදා ගන්නා අන්දම විස්තර කරන්න.

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 6**

6. Explain how living in flats is more environmentally friendly than living in large individual houses. **6**

විශාල තනි නිවාසවල ජීවත් වනවාට වඩා තට්ටු නිවාසවල ජීවත්වීම වඩාත් පරිසර හිතකාමී වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

**End of Section 1**

BLANK PAGE

Student/Registration Number

Centre Number

# 2022 PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

### Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2022

**Part A** (Questions 7–8)
(10 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts (for example, by comparing, contrasting, summarising and/or evaluating) and convey the information appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the question that follows.

**ලෝක උරුමයක් වන සිංහරාජය**

සිංහරාජ වන රක්ෂිතය ශ්‍රී ලංකාවේ නිරිත දිශාවේ හෙක්ටයාර 8864 ක් පුරා පැතිරී පවතී. එහි පවතින සරු සහ අද්විතීය ශාක හා සත්ත්ව ප්‍රජාව නිසා 1988 දී එය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

පර්යේෂකයින් සිංහරාජයට වැඩි ආරක්ෂාවක් අවශ්‍ය වන බව හඳුනා ගෙන ඇත. ඔවුන්ගේ සොයා ගැනීම් වලට අනුව එහි තිබෙන ගස්වලින් 60% කට වඩා ආවේණික වන අතර, ඒවායින් බොහොමයක් දුර්ලභ ඒවා වේ. වන රක්ෂිතය ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායින්ගේ සහ සමනලුන්ගෙන් 50% කට වැඩි ප්‍රමාණයක් මෙන්ම, බොහෝ පක්ෂීන්, කෘමීන්, උරගයින් සහ දුර්ලභ උභයජීවීන්ගේ ද නිවහනක් වේ.

එය ශ්‍රී ලංකාවේ ඉතිරිව ඇති අවසන් නිවර්තන තෙත් සදාහරිත වනාන්තරය වන අතර, මේ නිසාම වනාන්තරයක පවතින ස්වභාවික ජීව විද්‍යාත්මක ක්‍රියාවලීන් අධ්‍යයනය කිරීමට කදිම ස්ථානයකි. මීට අමතරව සිංහරාජය යනු නිල්වලා සහ ගිං ගංගාවල ජල පෝෂකයයි. තවත් සිත් ගන්නා කරුණක් වන්නේ ලංකාවේ වැදගත් පාෂාණ වර්ග දෙකක සංක්‍රාන්ති කලාපය තුළ සිංහරාජයේ පිහිටීමයි. ඒ නිසා ජෛව විවිධත්වය සඳහා නොවුනත් අපි මේ වනාන්තරය රැක ගත යුත්තේ අපේ පැවැත්ම සඳහාය.

අවාසනාවකට මෙන්, වසර ගණනාවක් පුරා සිංහරාජය එහි අඛණ්ඩ පැවැත්මට බලපාන නීති විරෝධී දැව කැපීමේ සිට මැණික් ගැරීම දක්වා විවිධ තර්ජන වලට මුහුණ දී ඇත.

QUESTION

**Marks**

Why does the Sinharaja Forest require extra protection? **5**

8. Read the text and then answer in ENGLISH the questions that follow.

## ශ්‍රී ලංකාවේ මනරම් උඩරට දුම්රිය මාර්ගය

කොළඹ සිට බදුල්ලට දුම්රියෙන් ගමන් කරන මගීන් අවට සොබා දහම රස විඳින මුත්, ඔවුන් ගමන් ගන්නා දුම්රිය මාර්ගයේ ඇති වැදගත් කම තේරුම් නොගනී.

දෙමෝදර ආරුක්කු පාලම හෙවත් ආරුක්කු නවයේ පාලම හරහා ඇති දුම්රිය මාර්ගය, 1921 දී ඉදි වූ ලෝකයම මවිත කළ නිර්මාණයක් වේ. තාක්ෂණය නොදියුණු කාලයක මෙවන් පාලමක් ගොඩ නැංවීම මහත් අභියෝගයක් වූ අතර, එය ශ්‍රී ලංකාවේ දුම්රිය සේවයේ විශාල වෙනසක් ඇති කිරීමට සමත්විය. මෙම දුම්රිය මාර්ගය බිංගෙවල් 42 ක් හරහා ගමන් කරයි. ඉතිහාසයට අනුව පළමු ලෝක යුද්ධය නිසා ඇති වූ වානේ හිඟයක් හේතුවෙන් බ්‍රිතාන්‍යයන් විසින් පාලමේ ඉදිකිරීම් නතර කළ අවස්ථාවේ ප්‍රදේශවාසීන් මැදහත් වී ගඩොල් සහ සිමෙන්ති භාවිතා නොකර, පාලම සම්පූර්ණයන්ම ඉදිකරන ලදී.

මෙම වැදගත් ඉදිකිරීම සඳහා නායකත්වය ලබාදෙනු ලැබුවේ සිංහල කාර්මිකයෙකු වූ කැප්පෙටිපොළ අප්පුහාමි වන අතර, ඒ සඳහා ඔහුට ප්‍රදේශවාසීන් ගෙන් සහාය ලැබුණි. ඔහු තම පළපුරුද්ද යොදා ගෙන අවට ප්‍රදේශවලින් ලබාගත් හුණුගල්, කලුගල් වැනි දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින්, විශේෂ බදාම වර්ගයක් නිපදවා, ඒ මගින් අත්හදා බැලීම් සිදුකරන ලදී. එමගින් ඉතා ශක්තිමත් බදාමයක් නිපදවීමට ඔහු සමත්විය. දුම්රිය මාර්ගයෙන් කොටසක් කඳු මුදුන් දෙකක් යා කරමින් ඉදිකිරීමට සිදුවූ අතර එය පහසු කාර්යයක් නොවුණි. මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලාංකික සහ සංක්‍රමණිකයන් 400 ක් පමණ අප්පුහාමි සමග සේවය කළ බව ඉතිහාසයේ සඳහන්වේ. මෙම ව්‍යාපෘතිය වසර කිහිපයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු විය. නමුත් වසරක් තුළදී, ඉතා අඩු වියදමක් යටතේ එය නිම කිරීමට අප්පුහාමිගේ ඉදිකිරීම් ක්‍රමයට හැකි විය.

QUESTIONS

**Marks**

(a) Explain why the construction of this railway line was considered a challenge for its time. **3**

(b) What was Kappetipola Appuhamy's valuable contribution to the construction of the railway line? **2**

**Part B** (Question 9)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *demonstrate an understanding of the stimulus text*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 8.

**තරුණ ඔබට නිවාඩු කඳවුරක්**

සිසුන් සඳහා දින හතක නේවාසික කඳවුරක් පිළිබඳව අපි ඉතා සතුටින් නිවේදනය කරමු. මෙහි අරමුණ තරුණ ඔබට දක්ෂතා පෙන්වීමට සහ අලුත් දේ ඉගෙනීමට අවස්ථාව ලබා දීමයි.

සැමගේ රුචිකත්වයට ගැලපෙන ක්‍රියාකාරකම් මෙහි ඇත. ඔබේ ප්‍රියතම ක්‍රීඩාවලට සහභාගී වීමටත්, වෙරළ සහ ලඳු කැළෑ ඔස්සේ පා ගමන් යාමටත් හැකිය. සංගීත ලෝලීන්ට ඔවුන්ගේ වාද්‍ය භාණ්ඩ ගෙනවිත් සංගීත සන්ධ්‍යා වලට ක්‍රියාකාරීව සහභාගී වීමට හැක. ඔබේ නිර්මාණ ප්‍රදර්ශණය කිරීමටත්, ඒකල සහ කණ්ඩායම් තරඟවලට සහභාගී වීමටත් හැක. අවසාන දිනයේ ජයග්‍රාහකයින් සහ සහභාගී වන්නන් සඳහා සහතික පත් සහ තිළිණ ලබා දෙනු ලැබේ. ඔබට විවිධ නිර්මාණශීලී වැඩමුළු වලට සහභාගී වී අලුත් දේ ඉගෙන ගැනීමට වැඩමුළුද පැවැත් වේ. අදාළ ක්ෂේත්‍රවල විශේෂ දක්ෂතා ඇති පුද්ගලයින් විසින් වැඩමුළුවල පුහුණු කිරීම් සිදු කරනු ලැබේ. සංවිධායකයින් විසින් නවාතැන් පහසුකම් ද, පිරිසිදු සමබර හා පෝෂ්‍ය ආහාර ද සපයා දෙනු ලබයි.

ස්ථාන සීමිතයි. වැඩිදුර විස්තර සඳහා සංවිධායකයින් අමතන්න.

QUESTION

You are keen to attend the holiday camp. You would like to go with a friend. Write an email to the organisers to persuade them to reserve two places, one for you and one for your friend.

ඔබට මෙම නිවාඩු කඳවුරට සහභාගි වීමට උනන්දුවක් ඇත. එයට ඔබගේ යහළුවෙකුද ගෙන යාමට ඔබ කැමැත්තක් දක්වයි. ඔබටත්, ඔබගේ යහළුවාටත් ස්ථාන දෙකක් වෙන් කරවා ගැනීමට පොළඹවමින් සංවිධායක කමිටුවට විද්‍යුත් ලිපියක් ලියන්න.

You may make notes in this space. These notes will NOT be assessed.

*Do not remove this page from the question booklet.*

Student/Registration Number

Centre Number

Sinhala Continuers Level

Question 9

**End of Section 2**

BLANK PAGE

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2022** PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2022*

## **Section 3** (Questions 10–12)
(20 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate depth of treatment of information, ideas and/or opinions*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. You often hear people say, ‘patience is a virtue’. Write an article for your school magazine, evaluating this statement.

    ‘ඉවසීම වටිනා ගුණාංගයකි’ යැයි අන් අය කියනු ඔබ අසා ඇත. මෙම කියමන අගයමින් පාසල් සඟරාවකට ලිපියක් ලියන්න.

11. You have always wanted a pet and you were given one as a birthday present. Write a diary entry describing the first day of living with a pet.

    ඔබට නිරන්තරයෙන්ම සුරතල් සතෙකු අවශ්‍ය වූ නිසා, උපන් දින තෑග්ගක් ලෙස එය ලැබුණි. සුරතල් සතා සමග ගත කළ පළමු දිනයේ අත්දැකීම් පිළිබඳව දින පොතේ සටහනක් ලියන්න.

12. You have dreamt that you had an opportunity to fly in a rocket with two of your friends. Write an imaginative short story that will be published in a magazine for young adults, about your adventures on the trip.

    යහළුවන් දෙදෙනෙකු සමඟ ඔබට රොකට්ටුවක පියාසර කිරීමට ලැබුණු අවස්ථාවක් ඔබ විසින් සිහිනයෙන් දකින ලදී. එම ගමනේදී ඔබට අත්දැකීමට ලැබුණු වීර ක්‍රියාවන් පිළිබඳව සඳහන් කරමින් තරුණ පරපුර වෙනුවෙන් පළකරන සඟරාවකට මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

You may make notes in this space. These notes will NOT be assessed.

Question Number:

**End of Section 3**